# 9 වන දවස

## ඔබගේ ශ්‍රී නාමය ශුද්ධ වේවා !

දෙවියන් වහන්සේ ශුද්ධ ය. එම නිසා වෙනස් ය. ඔවුන් වහන්සේ සිතන්නේ අප සිතන ආකාරයට නොවේ. **''සමිඳාණන් වන මම මෙසේ පවසමි, මාගේ සිතුවිලි නුඹේ සිතුවිලි මෙන් නොවේ. මාගේ මාර්ග නුඹේ මාර්ග මෙන් නොවේ''** (යෙසායා 55:8). දෙවියන් වහන්සේගේ සිතුවිලි සහ මාර්ග අහස පොළොවට වඩා ඉහළින් තිබෙනවා වගේ උසස් ය. අපගේ බුද්ධියට නම් බොහෝ විට මෙය නොතේරේ.

**''දිළිඳු වූ ඔබ භාග්‍යවන්ත ය. දැන් සාගිනි ඇති අය භාග්‍යවන්තයැ''**යි සමිඳාණෝ පවසති. අපගේ සිතුවිලිවලට මෙය නොගැලපේ, නොතේරේ. එහෙත් දේව ප්‍රඥාව සමිඳාණන්ගේ මේ වචන තුළ ගැබ්ව ඇත.

**''මන්ද මේ ලෝකයේ ප්‍රඥාව දෙවියන් වහන්සේ ඉදිරියෙහි මෝඩකමකි''** (1 කොරෙන්ති 3:19). දෙවියන් වහන්සේ පිළිබඳව අප දන්නේ ඉතා අල්ප මාත්‍රයකි. එයත් ඔවුන් වහන්සේ ම අපට අනාවරණය කර ඇති නිසා ය. දෙවියන් වහන්සේ වෙනස් නිසා අපට ඔවුන් වහන්සේ ව හුරුකර ගත නොහැක. ඔවුන් වහන්සේ ශුද්ධ නිසා ළංවිය නොහැක.

**දවස පුරා :-**

✵ ශුද්ධවූ වෙනස්වූ සර්වබලාරි දෙවියන් වහන්සේ කව්ද කියා අපට හඳුන්වා දුන්නේ ක්‍රිස්තුන් වහන්සේ ය. අද දින දේව වචනය කියවද්දී ක්‍රිස්තුන් වහන්සේ දෙස බලමින් පියාණන් වහන්සේ ගැන ඉගෙන ගනිමු.

✵ පුබුදු ගීතාංජලී ගී අංක 146